# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2158/17 - 2020 ජනවාරි මස 14 වැනි අඟහරුවාදා - 2020.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යයන් ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය, ගරු වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය හා ගරු මහවැලි රාජ්‍ය අමාත්‍යවරුන්ට පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ගෙන්, පහත උපලේඛනයේ දක්වා ඇති නිශ්චිත කාර්යයන් ඉටු කිරීමේ වගකීම් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා වෙතත්, ගරු වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා වෙතත්, ගරු මහවැලි රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ මැතිතුමා වෙතත් පහත සඳහන් පරිදි පවරනු ලබන බවත්, එසේම මෙම අමාත්‍යාංශයේ විෂයය පථයට ගැනෙන සියලු කාර්යයන් සම්බන්ධයෙන් සොයා බැලීමේ, මැදිහත් වීමේ හා සම්බන්ධීකරණය කිරීමේ අවස්ථාව තව දුරටත් රාජ්‍ය අමාත්‍යවරුන්ට ඇති බවටත් ප්‍රකාශයට පත් කරමි.

### උපලේඛනය

**කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. බෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | • බීජ වී පනත (2003 අංක 22) |
| 2. විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම, අධ්‍යාපන හා පර්යේෂණ අවස්ථා පුළුල් කිරීමට ක්‍රමවේද සැකසීම. | 2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. | • පස් සංරක්ෂණ පනත (1996 අංක 24) |
| 3. කුඹුරු ඉඩම් උපරිම ලෙස කෘෂිකර්ම බෝග වගාවන් සඳහා යොදා ගැනීමට මුල්තැන ලැබෙන පරිද්දෙන් එම ඉඩම්වලට අදාළ සියලු කටයුතු ඉටු කිරීම. | 3. ජාතික පොහොර ලේකම් කාර්යාලය | • කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47) |
| | 4. සීමාසහිත ලංකා පොහොර සමාගම | • පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68) |
| | 5. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | • ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46) |
| | 6. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස් | • කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1978 අංක 11) |

උපලේඛනය (සම්බන්ධිතයි)

**කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 4. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම. | | |
| 5. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම. | | |
| 6. කාබනික පොහොර නිෂ්පාදනය සහ වස විසෙන් තොර ගොවිතැන් ප්‍රචලිත කිරීම. | | |

**වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම | 1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව. | • වාරිමාර්ග ආඥා පනත (1946 අංක 22) |
| 2. වාරිමාර්ග හා ජලපවහන පද්ධති ඉදිකිරීම, ක්‍රමවත් නඩත්තුව මගින් අවශ්‍ය ජල සැපයුම ක්‍රමානුකූලව ලබාදීම හා ජල ගැලීම් පාලන යෝජනා ක්‍රම තුළින් ජලාපවහන හා ගංවතුර පාලනය සිදු කිරීමට කටයුතු කිරීම | 2. ග්‍රාමීය පුණර්ජීවන අරමුදල | • සත්ත්ව රෝග පනත (1992 අංක 59) |
| 3. කෘෂිකාර්මික සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රතිපත්තිමය ලෙසින්, විදුලිය හා පානීය ජලය සැපයීමට අවශ්‍ය ජලාශ හා වාරි පහසුකම් මනා ලෙස කළමනාකරණයක් පවත්වාගෙන යාම | 3. ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල (මූල්‍ය) | • සත්ත්ව ආහාර පනත (1986 අංක 15) |
| 4. ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි නිශ්චිත වශයෙන් නිර්ණය කර ඒවා තිරසාර අයුරින් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම | 4. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල) | • සත්ත්ව පනත (1958 අංක 29) |
| 5. ගංගා, ඇළ, දොළ, වැව් ආදී ජල මූලාශ්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම | 5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | • පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46) |
| 6. ජල දූෂණය පාලනය කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම | 6. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | |
| | 7. මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ් හා ආශ්‍රිත සමාගම් | |
| | 8. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටප්‍රයිසස් සමාගම | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 7. වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 8. වේලි ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම | | |
| 9. කරදිය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම | | |
| 10. භූගත ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම සහ වැසි ජල සංරක්ෂණය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම | | |
| 11. භූ සම්පත්හි තිරසර භාවිතය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | |
| 12. පශු සම්පත් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම | | |
| 13. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු | | |
| 14. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 15. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 16. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු | | |
| 17. ග්‍රාමීය ජනදිවිය සවිබල ගැන්වීමට අදාළ යටිතල මූල්‍ය පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනය තුළින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |

**උපලේඛනය (සම්බන්ධිතයි)**

**මහවැලි රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. මහවැලි ගොවි ජනපදවල සංවර්ධන කටයුතු | 1. මොරගහකන්ද සහ කළු ගඟ ජලාශ ව්‍යාපෘති | • වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14) |
| 2. මහවැලි ගොවි ජනපදවල ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා වන ව්‍යාපෘති සම්බන්ධීකරණය | 2. මහවැලි ඒකාබද්ධ (කලාප බී පුනරුත්ථාපන) ව්‍යාපෘතිය | |
| 3. මහවැලි ගොවි ජනපද ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවලට සහය ලබා දීම | 3. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | |
| 4. වී, ධාන්‍ය හා අනෙකුත් කෘෂි බෝග මිලදී ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අලෙවියට අදාළ කටයුතු කිරීම | 4. වී අලෙවි මණ්ඩලය | |

ඉහත පරිදි ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ට පවරන ලද විෂයයන් හා කාර්යයන් මාගේ අධීක්ෂණයට හා අනුමැතියට යටත් වේ.

චමල් රාජපක්ෂ,
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය.

2020 ජනවාරි මස 06 වැනි දින,
නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

01 - 701

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.